# නව කොරෝනා වෛරසය පැතිරයාම  වැලැක්වීම සඳහා  අඹඅ පාසල ගෙන ඇති පියවර හා ක්‍රියාමාර්ග

 අප පාසල අප්‍රේල් මාසයේ සිට අන්තර්ජාලය ඔස්සේ පාඩම් ආරම්භ කල අතර ජුනි මාසයේ සිට පාසල තුලද පංති ආරම්භ කලෙමු. අධ්‍යන දින වකවානු හා කාලසටහන් සකස් කල අධ්‍යන පටිපාටියෙහි ප්‍රතිඵලයක් ලෙස, අධ්‍යන කාලය තුලදී සුරක්ෂිතව  නවක සිසුන් හා වත්මන් සිසුන් එක් එක්  ශ්‍රේණියේ අධ්‍යන පාඨමාලාව අවසන් කිරිමට හා උපාධිය ලබා දීමට සහතික වෙමු . රැකියා සෙවීමේ ක්‍රියාදාමයේදීද,  අන්තර්ජාලය ඔස්සෙ සම්මුඛ පරීක්ෂණ වලට සහබාගී කරවීම වැනි ක්‍රියාමාර්ග අනුගමනය කරන අතර එය දුෂ්කර වුවද සක්‍රීයව දායකත්වය ලබා දෙමු .
 අප පාසල රජය , අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා හා තාක්ෂණික අමාත්‍යාංශයේ හා තෝකියා යනාදියෙහි දැනුවත් කිරීම් හා තොරතුරු මත පදනම්ව සිසුන් , කාර්‍ය මණ්ඩලය හා පාසලට සම්බන්ධ සියළුම පාර්ශවයන්ගේ  ආරක්ෂාව සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන අතර  රෝගය බෝ වීම වැලැක්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත .

## රෝගය බෝවීම වැළැක්වීම සඳහා අප පාසල ගෙන ඇති පියවර

❖ පාසලට ඇතුල් වීමේදී ශරීර උෂ්ණත්ව පරීක්ෂාව හා විෂබීජහරණය

- පාසලට ඇතුල්වන දොරටුව අසල ශරීර උෂ්ණත්ව මිණුම් සවිකර ඇති අතර සියළුම සිසුන් හා කාර්‍ය මණ්ඩලය ශරීර  උෂ්ණත්ව පරීක්ෂාවක් හා විෂබීජහරණයට ලක් කෙරේ.

❖ 「Three CS」 වලින් වැලකී පංති පැවැත්වීම හා අන්තර්ජාලය ඔස්සේ පංති පැවැත්වීම(6/1)

- නවක සිසුන් හා වත්මන් සිසුන් පාසලට පැමිණෙන දින,වේලාවන් වෙන් කොට ජන ඒකරාශි වීම් හා පුද්ගල දුරස්තබාවය රැකගෙන පංති පැවැත්වීම .

- පාසල තුළ පංති පැවැත්වීම හා ස්වයං අධ්‍යනය ඒකාබද්ධ කළ අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම .

❖ මුඛ ආවරණ පැළදීම, පිරිසිදු වාතාශ්‍රය හා විෂබීජනාශක භාවිතය.

- පංති කාමරය තුල මුඛ ආවරණ පැළදීම අනිවාර්ය  කිරීම.

- පාඩම් අතරතුර පංති කාමර තුල පිරිසිදු වාත හුවමාරුව.

- පංති කාමරය භාවිතයෙන් අනතුරුව සිසුන් හා ගුරුවරුන් එක්ව විෂබීජනාශක භාවිත කොට පංතිය පිරිසිදු කිරීම.